# දැන්වීමයි

## සියලු අධ්‍යයන, පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලවල ස්ථිර සේවකයන් සඳහා

කොළඹ විශ්ව විද්‍යාලයේ කාර්යමණ්ඩලය සඳහා වන සෞඛ්‍යය සුබසාධන යෝජනා ක්‍රමය-
2022
ප්‍රතිලාභ ලබා ගැනීමට සම්පූර්ණ කළ යුතු කරුණු:

**** 2022 වෛද්‍ය සුභසාධන ක්‍රමය සඳහා අලුතින් ලියාපදිංචි වන සේවක මහත්ම මහත්මීන් හට ප්‍රතිලාභ ඉල්ලුම් කල හැක්කේ, අවම වශයෙන් මාස 12 ක වාරික ගෙවීමකින් පසුවය. ****

1. සෞඛ්‍යය සුබසාධන යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබාගැනීමට අයදුම්කිරීමේදී වෛද්‍ය නිළධාරි/ රෝහල් විසින් නිකුත් කරන වෛද්‍ය නිර්දේශ/ රෝග විනිශ්චයපත් ( diagnosis card) වල පහත සඳහන් කරුණු සඳහන් කිරීම අනිවාර්ය වේ.

   I. රෝගියාගේ නම සහ දිනය
   II. නේවාසික රෝගියකු නම් අංශ ප්‍රධානී විසින් සහතික කරන ලද රෝග විනිශ්චයපත
   III. වෛද්‍ය නිර්දේශ පත්වල වෛද්‍ය නිළධාරියා/ බෙහෙත් ශාලාවේ ලිපි ශීර්ෂය ( letterhead) සඳහන් නොවන්නේ නම් වෛද්‍ය නිර්දේශපත්වල වෛද්‍ය නිළධාරිගේ නිලමුද්‍රාව තිබිය යුතුය.( මුද්‍රාවේ වෛද්‍යවරයාගේ නම සහ ලියාපදිංචි අංකය සඳහන් විය යුතුය.)

2. ශල්‍ය වෛද්‍ය කටයුතු සඳහා මෙම යෝජනා ක්‍රමය මගින් ආවරණය කරනු ලබන්නේ සෞඛ්‍යය අමාත්‍යාංශයේ Private Health Services Regulatory Council (PHSRC) යටතේ ලියාපදිංචි වූ පෞද්ගලික රෝහල්වල කරන ලද ප්‍රතිකාර පමණක් වේ.

3. රිසිට්පත්/ බිල්පත් ඖෂධවේදී විසින් නිලමුද්‍රාව යොදා සහතික කළ යුතුය.

4. රෝහල් විසින් නිකුත් කරන වෛද්‍ය නිර්දේශවලද රෝගියාගේ නම, / රෝග විනිශ්චය සහ අදාළ වෛද්‍ය නිළධාරියාගේ නම හෝ ඔහුගේ / ඇයගේ නිල මුද්‍රාව දිනය සමග සඳහන් විය යුතුය.

5. කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය නිලධාරි / අංශ ප්‍රධානී විසින් ප්‍රතිපූරණය සඳහා නිර්දේශ නොකරනු ලබන බිල්පත් ප්‍රතිපූරණය සඳහා සලකා බලනු නොලැබේ.

6. සෞඛ්‍යය සුබසාධන යෝජනා ක්‍රමයෙන් ආවරණය වන්නේ බිල්පතේ සඳහන් ඖෂධ අතරින් වෛද්‍යවරයා නිර්දේශ කළ ඖෂධ වර්ග වල මිල පමණකි.

7. පෞද්ගලික රෝහල් මගින් නිකුත් කළ බිල්පත් ගෙවන ලද බවට (paid) මුද්‍රා තබා තිබිය යුතුය.

8. <u>එන්නත් සඳහා</u> ප්‍රතිලාභ ලබාගත නොහැකිය.

9. වෛද්‍ය පරීක්ෂණ සඳහා ගෙවීම් කළ බිල්පත්වල අදාළ වෛද්‍ය පරීක්ෂණයේ නම සඳහන් විය යුතුය.

10. තොරතුරු වෙනස්කර හෝ විකෘති කර ඇති බිල්පත් අදාළ වෛද්‍යවරයාගේ නිලමුද්‍රාව යොදා තහවුරු කළ යුතුය.

11. සැත්කම් හා රෝහල් ගාස්තු ගෙවීමේදී අදාළ අයදුම්කරුගේ අත්සන සාක්ෂිකරුවකු විසින් සහතික කළ යුතුය.

12. අලුත් දරු උපතකදී දරුවාගේ නම සාමාජික ලැයිස්තුවට ඇතුළත් කර ගැනීමට අදාළ සාමාජිකයා විසින් දරුවාගේ උප්පැන්න සහතිකය සමග ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය.

13. කලත්‍රයාගේ නම සාමාජික ලයිස්තුවට ඇතුළත් කර ගැනීම සඳහා අදාළ සාමාජිකයා විසින් සිය විවාහ සහතිකය සමඟ ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය.

14. සාමාජිකයන් සිය හිමිකම් අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී අදාළ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය අනුව ශිෂ්‍ය හා සේවක කටයුතු අංශයේ ලියාපදිංචි විය යුතුය. තැපැල් මගින් එවනු ලබන හිමිකම් අයදුම්පත් හෝ ඊට අදාළ බිල්පත් තැපැලේදී නැතිවීම පිළිබඳ ශිෂ්‍ය හා සේවක කටයුතු අංශය වගකියනු නොලැබේ.

15. ඊ- චැනලින් (e – channeling) ක්‍රමය යටතේ කළ ගෙවීම් ලබා ගැනීමේදී අදාළ බිල්පත වෛද්‍ය වෘත්තිකයාගේ/ රෝහලේ නිලමුද්‍රාව සමග ඉදිරිපත් කළ යුතුය. කල්තබා වෙන්කරගැනීම් ගාස්තු (booking charges) ආවරණය කරනු නොලැබේ.

16. බාහිර රෝගී බිල්පත් රු.1000/- හෝ ඊට වඩා වැඩිනම් නිර්දේශකරන ලද ඖෂධවර්ග බිලෙහි සඳහන් විය යුතුය.

17. රූපලාවන්‍යය සැත්කම් සම්බන්ධ ප්‍රතිකාර ප්‍රතිපූරණය කරනු නොලැබේ.

18. බාහිර ප්‍රතිකාර සහ වෛද්‍ය පරීක්ෂණ ගෙවීම් සඳහා හිමිකම් කිව හැක්කේ **වසරකදී උපරිම වශයෙන් 03 වරක් පමණයි.**

19. ***කිසියම් පැහැදිලි කිරීමක් අවශ්‍ය අවස්ථාවකදී ඒ සඳහා ඉංග්‍රීසි පිටපත වලංගු වේ.***

***ඔබේ ගෙවීම් කටයුතු කඩිනම් කිරීමට එය පිටිවහල් වේ.***

for ලේඛකාධිකාරී,
කොළඹ විශ්ව විද්‍යාලය.